# සීමානිර්ණ කමිටු වාර්තාව මසක් ඇතුළත ගැසට් කරනවා

## - ෆයිසර් මුස්තාපා



**කමල් මහේන්ද්‍ර වීරරත්න**

මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණ කමිටු වාර්තාව නොවරදවාම මසක් ඇතුළත ගැසට් කරන බවට පළාත් පාලන අමාත්‍ය ෆයිසර් මුස්තාපා මහතා ඊයේ (30) ශ්‍රේෂ්ඨාධිකරණයට සිය නීතිඥවරයා මගින් පොරොන්දුවක් දුන්නේය.

10

## සීමා නිර්ණ කමිටු...

රිවිර Online

ඇමැතිවරයා වෙනුවෙන් පෙනී සිටි ජනාධිපති නීතිඥ රොමේෂ් ද සිල්වා මහතා ත්‍රිපුද්ගල ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චය මණ්ඩලයක් හමුවේ ඇමැතිවරයාගේ පොරොන්දුව ඉදිරිපත් කළේය.

ප්‍රියසාද් ඩෙප්, උපාලි අබේරත්න හා නලීන් පෙරේරා යන ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකරුවන්ගෙන් ත්‍රිපුද්ගල විනිශ්චය මණ්ඩලය සමන්විත විය.

ඉහත පොරොන්දුව ලබා දීමට අමාත්‍ය මුස්තාපා මහතාට සිදුවූයේ සීමා නිර්ණ කමිටු වාර්තාව නිකුත් කිරීම රජය විසින් හිතාමතාම පමා කිරීම මගින් යෝජිත පළාත් පාලන මැතිවරණ පැවැත්වීම කල් දැමීමේ කූට ප්‍රයත්නයක යෙදී සිටින්නේ යැයි පවසමින් පැෆරල් සංවිධානය ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ගොනු කළ මූලික අයිතිවාසිකම් පෙත්සමට වගඋත්තර බදිමිනි.

ඇමැතිවරයාත්, මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කමිටුව හා එහි සියලු සාමාජිකයනුත් එම පෙත්සමෙන් වගඋත්තරකරුවන් කොට ඇත.

පැෆරල් සංවිධානයේ (නිදහස් හා සාධාරණ මැතිවරණ සඳහා වූ ජනතා ක්‍රියාකාරීත්වය) විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා එම පෙත්සම ගොනු කොට ඇත. ඉහත පෙත්සම විභාගය සඳහා අවසර දෙමින් එහි දැක්වෙන චෝදනා සම්බන්ධයෙන් වගඋත්තර ඉදිරිපත් කරන ලෙස ඉකුත් නඩු දිනයේදී ඇමැතිවරයා ප්‍රමුඛ වගඋත්තරකරුවන්ට ශ්‍රේෂ්ඨාධිකරණය නියම කළේය.